සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | | |
|---|---|---|
| ඉස්ලාම් ශිෂ්ටාචාරය I<br>இஸ்லாமிய நாகரிகம் I<br>Islamic Civilization I | **47 S I** | 2018.08.06 / 0830 - 1030<br>පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

---

**1.** නබිතුමාගේ සගයන් අතුරෙන් අස්හාබුස් සුෆ්ෆාවරුන්ගෙන් කෙනෙක්ව සිට හදීස් ක්ෂේත්‍රයට විශිෂ්ට සේවාවක් කරනු ලැබුවේ,
(1) සයිද් බින් සාබිත් (රළි) ය. (2) අබූ හුරෙරා (රළි) ය.
(3) ඉබ්නු මස්ඌද් (රළි) ය. (4) බිලාල් (රළි) ය.
(5) ඉබ්නු අබ්බාස් (රළි) ය.

**2.** නබිතුමාගේ වයස අවුරුදු පහළොවේදී මක්කාහි සිදු වූ යුද්ධය කුමක් ද?
(1) හර්බුල් ෆුජ්ජාර් (2) හර්බුල් නජ්ජාර් (3) හර්බුල් ෆුලූල් (4) හර්බුල් ෆුආද් (5) හිල්ෆුල් ෆුලූල්

**3.** ජාහිලියියා සමයේ භාවිතයේ පැවති විවාහ ක්‍රම දක්වන නිවැරදි කාණ්ඩය තෝරන්න.
(1) ඉස්තිෆ්ලාඃ, අල්-මුත්ආ, සිකායා, තවාතිඃ
(2) අත්තවාතිඃ, අත්තමත්තු, අල්-මුත්ආ, අල්-ඉස්මත්
(3) නිකාහ් සහීහ්, නිකාහුල් ඉස්තිෆ්ලාඃ, නිකාහුල් මුත්ආ, නිකාහුශ් සරීත්
(4) අල්-ඉස්තිෆ්ලාඃ, අත්තවාතිඃ, අල්-මුත්ආ, අෂ්ෂඃකාර්
(5) අස්සිකායා, අර්රිෆාදා, අල්හිජාබා, අත්තියාරා

**4.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අකබා ගිවිසුම නබිතුමා සහ නජ්ජාසි රජු අතර අත්සන් කරන ලද්දකි.
(2) අයිෂා(රළි)තුමිය 'තාතුන් නිතාකයින්' නමැති ගෞරව නාමයෙන් හඳුන්වන ලදී.
(3) මදිනා ශාසනය කුරයිෂිවරුන් හා මදීනා මුස්ලිම්වරුන් අතර සිදු කරන ලද්දකි.
(4) තායිෆ් සඳහා වූ හිජ්රත්හි දී මුස්ලිම්වරු පිළිගන්නා ලදී.
(5) මක්කා ජයග්‍රහණය හිජ්රි අටවන වර්ෂයේදී සිදු විය.

**5.** පහත සඳහන් පාලකයින් අතුරෙන් ඉන්දියානු මුස්ලිම් රජ පෙළපතට අයත් **නොවනුයේ,**
(1) මෝගල්වරුන් ය. (2) මුවහ්හිදූන් ය. (3) තුක්ලක්වරුන් ය. (4) අයිබක්වරුන් ය. (5) ලෝඩිවරුන් ය.

**6.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තොරතුරු දෙපාර්තමේන්තුව අරාබි බසින් දීවානුල් රසාඉල් ලෙස හඳුන්වනු ලැබේ.
(2) හදීස් කලාවේ 'මතන්' යනු විචාරාත්මක කලාවකි.
(3) ඉස්ලාම් ප්‍රතිසංස්කරණවාදීන් මුජද්දිත් ලෙස හැඳින්වේ.
(4) මද්හබ් බිහිවීම හා ඉජ්තිහාද් අතර සබඳතාවයක් නැත.
(5) කලීෆා මාමූන් විසින් බයිතුල් හික්මා පිහිටුවන ලදී.

**7.** පහත සඳහන් ප්‍රකාශවලින් තුනක් එක්තරා කලාවකට ගැළපෙන අතර අනෙක් ප්‍රකාශ දෙක ඊට ප්‍රතිවිරුද්ධ ප්‍රකාශ වේ.
A - 'අස්බාබ් අන්නුසුල්' යනු අල්-කුර්ආන් වදන් පහළ කිරීමට හේතු වූ පසුබිම සඳහන් කිරීම වේ.
B - 'මුඅත්තා' යන ග්‍රන්ථය ඉමාම් මාලික්තුමා විසින් රචනා කරන ලදී.
C - කලීෆා උස්මාන් (රළි)තුමා 'ජාමිඋල් කුර්ආන්' යන ගෞරව නාමයෙන් හැඳින්වේ.
D - ඉබ්නු අබ්බාස් (රළි) තෆ්සීර් කලාවේ විශාරදයකු වේ.
E - සහීහයින් යනු ඉමාම් බුහාරි හා ඉමාම් මුස්ලිම් යන අයට අයත් වූවකි.

ඉහත සඳහන් ප්‍රකාශවලින් නියමිත කලාවට **ප්‍රතිවිරුද්ධ** ප්‍රකාශ දෙක මොනවා ද?
(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා D (5) B හා E

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**8.** ඉස්ලාම් ඉතිහාසයේ බිහිවූ ප්‍රතිවිරුද්ධ මත දරණ සම්ප්‍රදායන් අතුරෙන් මැතකාලීන මතධාරී කණ්ඩායම වන්නේ,
(1) කාදියානි ය. (2) ෂිආ ය. (3) කවාරිජ් ය. (4) මුර්ජිආ ය. (5) ජබරියියා ය.

**9.** හදීස් කලා ඉතිහාසයේ 'මව්ලූආද්' යන පදයෙන් දක්වන අර්ථය වන්නේ,
(1) ෂිආවරුන් විසින් අර්ථ දක්වන ලද යන්න ය.
(2) අපැහැදිලි තේරුම් සහිත අර්ථ දැක්වීම් යන්න ය.
(3) නබි මුහම්මද් (සල්)තුමා විසින් කියන ලද ඒවා යැයි අතිශෝක්තියෙන් ලියන ලද යන්න ය.
(4) කවාරිජ්වරුන්ගේ දැන්වීම් යන්න ය.
(5) දැනුම් දෙන්නන්ගේ පෙළෙහි නබිතුමාගෙන් පසුව තාබිර් ලෙස ඉස්නාද් සහිත හදීස් යන්න ය.

**10.** කලීෆා උමර් (රලි) හා සම්බන්ධ කරුණ වන්නේ,
(1) තමාගේ උරුමක්කාරයා ලෙස උස්මාන් (රලි)තුමා පත් කිරීම ය.
(2) හිජ්රි හයවන වර්ෂයේ ඉස්ලාම් ධර්මය පිළිගැනීම ය.
(3) හිජ්රි දහතුන වර්ෂයේදී කිලාෆත් භාරගැනීම ය.
(4) සයිෆුල්ලා යන ගෞරව නාමය ලැබීම ය.
(5) කුලාෆා උර්රාෂිදීන්වරුන් අතුරෙන් වැඩිම කාලයක් පාලනය කිරීම ය.

**11.** උමයියා, අබ්බාසියා, උස්මානියා පාලනයේදී පරිපාලන අගනුවර වූයේ පිළිවෙළින්,
(1) මදීනා, ඩමස්කස් හා ඉස්තාන්බුල් ය.
(2) ඩමස්කස්, බග්දාද් හා ඉස්තාන්බුල් ය.
(3) මක්කා, කුෆා හා බසාරා ය.
(4) මක්කා, මදීනා හා ඩමස්කස් ය.
(5) ඩමස්කස්, කොරඩෝවා හා ඉස්තාන්බුල් ය.

**12.** අබ්දුල්ලා බින් උරයික්කත්, සෆ්වාන් ඉබ්නු උමයියා යන මුස්ලිම් නොවන දෙදෙනා ප්‍රධාන සිද්ධි දෙකකදී නබිතුමාට සහය දුන්හ. එම සිද්ධි දෙක මොනවා ද?
(1) හිජ්රත් හා හුදයිබියා ගිවිසුම
(2) හිජ්රත් හා පළමු අකබා ගිවිසුම
(3) හිජ්රත් හා හුනයින් යුද්ධය
(4) හිජ්රත් හා බද්ර් යුද්ධය
(5) ඇබිසීනියා හිජ්රත් හා කන්දක් යුද්ධය

**13.** පහත වගුවේ **X** තීරයෙන් ප්‍රසිද්ධ ගොඩනැගිලිවල නම් ද, **Y** තීරයෙන් ඒවා ස්ථානගත වී ඇති නගරවල නම් ද, **Z** තීරයේ ඒවා නිර්මාණය කළ අයගේ නම් ද දැක්වේ.

| X | Y | Z |
|---|---|---|
| **1** - අල් හම්රා | **A** - දිල්ලිය | **D** - අම්රිබ්නල් ආස් |
| **2** - ජාමිඋල් අම්රිබ්නල් ආස් | **B** - කයිරෝ | **E** - අයිබක් |
| **3** - කුතුබ් මිනාර් | **C** - ස්පාඤ්ඤය | **F** - අල් අහ්මර් |

මෙහි **X** තීරයට සුදුසු වන පරිදි **Y** සහ **Z** තීර නිවැරදිව සකස් කරන ලද වරණය තෝරන්න.
(1) BE, AF, CD (2) AF, BE, CD (3) CF, BD, AE (4) CE, BD, AF (5) AD, BE, CF

**14.** ඉස්ලාම් ශිෂ්ටාචාරයෙහි ලක්ෂණයක් වනුයේ,
(1) තෝරාගත් එක් ජන වර්ගයක් පමණක් ඉලක්ක කර තිබීම ය.
(2) දේශපාලනය සහ ආගම වෙන් කර දැක්වීම ය.
(3) පැවිදිභාවය පමණක් ඉගැන්වීම ය.
(4) අධ්‍යාත්මය සහ ලෞකිකත්වය සම්බන්ධ කොට දැක්වීම ය.
(5) හොඳ නරක බෙදා වෙන් කර හඳුනාගැනීමේ හැකියාවට මුල් තැන දීම ය.

● අබ්බාසි යුගයේ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ වර්ධනය හේතු කොට ගෙන බිහි වූ විවිධ ක්ෂේත්‍රවල විද්වතුන්ගේ නම් පහත සඳහන් වේ. මෙය පාදක කරගෙන **15** සිට **20** දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - අර්රාසි
B - ඉබ්නු සීනා
C - නාසිරුද්දීන්-තූසි
D - අල්ෆර්හානි
E - හිෂාම් අල් කල්බි
F - අල් කින්දි
G - ඉබ්රාහිම් අල් බසාරි
H - අල් ඉද්රිසි
I - මුහම්මද් බාකි
J - උමර් කයියාම්
K - අල් කුවාරිස්මි
L - ඉබ්නු කල්දූන්
M - වාකිදි
N - ෂහ්රාවි
O - අල් ෂර්කාලි

**15.** 'කිතාබුත් තාරික් වල් මකාසිති', 'මුකද්දිමා' යන ඓතිහාසික ග්‍රන්ථ ලියූ විද්වතුන් පිළිවෙළින්
(1) A හා B වේ. (2) E හා L වේ. (3) I හා M වේ. (4) L හා M වේ. (5) M හා L වේ.

[තුන්වැනි පිටුව බලන්න.

**16.** සෙල්ජුක්වරුන්ගේ යුගයේ සුප්‍රසිද්ධ පුද්ගලයෙකු වූත් 'මකාලත් බිල් ජබර් වල් මුකාබලා' යන ගණිත ග්‍රන්ථය රචනා කළ විද්වතා වූත් පුද්ගලයා
(1) A ය. (2) B ය. (3) G ය. (4) H ය. (5) J ය.

**17.** වෛද්‍ය ක්ෂේත්‍රයට දායකත්වය දැක් වූ එකල ප්‍රධාන පෙළේ වෛද්‍යවරු තිදෙනෙක් වන්නේ,
(1) A, B හා N ය. (2) A, B හා J ය. (3) A, D හා B ය. (4) A, E හා F ය. (5) B, C හා H ය.

**18.** අබ්බාසි කලීෆා මාමූන් යුගයේ 'PTOLEMY' යන භූගෝල විද්‍යා ග්‍රන්ථය පදනම් කොටගෙන 'කිතාබු සූරතුල් අර්ල්' යන සුප්‍රසිද්ධ භූගෝල විද්‍යා ග්‍රන්ථය රචනා කළේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) F ය. (5) K ය.

**19.** තාරකා ශාස්ත්‍ර පිළිබඳ සුප්‍රසිද්ධ විද්වතුන් ඇතුළත් කාණ්ඩය වනුයේ,
(1) A හා J ය. (2) B හා F ය. (3) C හා O ය. (4) D හා M ය. (5) E හා O ය.

**20.** මංගාගේ 'සිද්ධාන්ත' යන ග්‍රන්ථය අනුගමනය කොට පර්යේෂණ සිදු කළ, එවක ඉස්ලාමික ලෝකයේ පළමුවන තාරකා ශාස්ත්‍රඥයා ලෙස පිළිගැනෙන විද්වතා වන්නේ,
(1) F ය. (2) G ය. (3) H ය. (4) J ය. (5) K ය.

**21.** අල්-කුරානයේ සඳහන් ඇතැම් නීති ඉබාරතුන් නස්, ඉෂාරතුන් නස්, ඉක්තිලා උන් නස් ලෙස වෙන් කර දක්වයි. එයින් ඉබාරතුන් නස් යනු,
(1) පැහැදිලි නීති වේ. (2) සැඟවුණු නීති වේ. (3) වැරදි නීති වේ.
(4) අපැහැදිලි නීති වේ. (5) ක්‍රමික නීති වේ.

**22.** අස්සිහාහුස්සිත්තා දුන් ඉමාම්වරු හයදෙනා අතුරෙන් ඉමාම්වරු තිදෙනෙකුගේ හදීස් ගොනු කිරීම සුනන් ලෙස හඳුන්වයි. එම ඉමාම්වරුන්ගේ නම් ඇතුළත් කොටස් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ඉමාම් බුහාරි, අහ්මද් හා තිර්මිදි (2) ඉමාම් මුස්ලිම්, තිර්මිදි හා නසර්
(3) ඉමාම් අබුදාවුද්, නසර් හා මුස්ලිම් (4) ඉමාම් බුහාරි, මුස්ලිම් හා ඉබ්නු මාජා
(5) ඉමාම් අබුදාවුද්, නසර් හා ඉබ්නුමාජා

**23.** විවාහයකදී මනමාලයා විසින් මනමාලියට දෙනු ලබන ත්‍යාගය
(1) දැවැද්ද වේ. (2) ඊජාබ් වේ. (3) කබූල් වේ. (4) මහර් වේ. (5) කෛකුලි වේ.

**24.** ව්‍යාජ නබිවරුන් අතර අධික යුධ ශක්තියකින් මුස්ලිම්වරුන්ට විරුද්ධව සටන් කළේ,
(1) අස්වත් අන්සි ය. (2) සජා ය. (3) මුසයිලමා ය.
(4) තුලයිහා ය. (5) මිර්සා ගුලාම් අහ්මද් ය.

**25.** පහත නම් වලින් 'ඇසූ පිරූ තැන්' ඇති හැඳින්වීමට භාවිත කරන පදය වන්නේ,
(1) අහ්ලුර් රඃයු ය. (2) අහ්ලුල් කුර්ආන් ය. (3) අහ්ලුල් කිතාබ් ය. (4) අහ්ලුල් හදීස් ය. (5) අහ්ල් බයිත් ය.

● පහත සඳහන් වනුයේ ඉස්ලාමික කලාවන් හා සම්බන්ධ වන විවිධ පාරිභාෂික පද වේ. ඒවා භාවිත කොට **26** සිට **30** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රිසාලත්
B - නිකාහ්
C - වහි
D - මිනාරා
E - රාවි
F - මආද්
G - තෆ්සීර්
H - මහර්
I - මිහ්රාබ්
J - තව්හිද්
K - මිම්බර්
L - මතන්
M - ඉස්රායිලියියාත්
N - තලාක්
O - අස්මාඋර් රිජාල්

**26.** අකීදා සමග සම්බන්ධ වචන මොනවා ද?
(1) A, D හා G (2) A, F හා J (3) B, C හා O (4) E, H හා K (5) F, L හා M

**27.** අල්-කුර්ආන් සමග සම්බන්ධ වචන මොනවා ද?
(1) B, C හා M (2) C, F හා H (3) C, G හා M (4) C, H හා O (5) C, I හා L

**28.** පවුල් ජීවිතය හා සම්බන්ධ වචන මොනවා ද?
(1) A, B හා H (2) A, C හා H (3) B, H හා N (4) C, F හා J (5) C, F හා K

**29.** හදීස් කලාව හා සම්බන්ධ වචන මොනවා ද?
(1) A, B හා C (2) B, L හා O (3) C, L හා O (4) E, L හා O (5) K, L හා O

**30.** ඉස්ලාමික ගෘහ නිර්මාණ හා සම්බන්ධ වචන මොනවා ද?
(1) A, I හා K (2) B, F හා K (3) B, I හා K (4) C, G හා L (5) D, I හා K

**31.** 'ඉස්ලාමික නීති කලාව පිළිබඳ ඓතිහාසික දෘෂ්ටිය' යන ග්‍රන්ථය රචනා කළ කතෘවරයා
(1) සී.එම්.ඒ. අමීන් ය. (2) ඒ.එම්.ඒ. අසීස් ය.
(3) ආචාර්ය එම්.ඒ.එම්. සුක්රි ය. (4) එම්.අයි.එම්. අමීන් ය.
(5) ඒ.එම්. අබුබක්කර් ය.

**32.** ශ්‍රී ලංකාවේ මුස්ලිම් පුද්ගල නීති සංග්‍රහයේ ඇතුළත් **නොවන** අංගය කුමක් ද?
(1) දික්කසාද (2) උරුමක්කාරයින්ගේ දේපළ
(3) මහර් සහ කෛකුලි (4) ස්වාමිපුරුෂයා හා භාර්යාවගේ යුතුකම් හා අයිතිවාසිකම්
(5) බහුභාර්යා විවාහ

**33.** කෝයා ජාන් නැමැත්තා ඔහුගේ බලය යටතේ තබාගෙන සිටි වරාය කුමක් ද?
(1) කොළඹ (2) ත්‍රිකුණාමලය (3) බේරුවල (4) මාතර (5) හම්බන්තොට

**34.** මුස්ලිම් වාර්ගිකත්වය සම්බන්ධව සර් පොන්නම්බලම් රාමනාදන්ගේ අදහස ප්‍රතික්ෂේප කළ මුස්ලිම් විද්වතා වන්නේ,
(1) අයි.එල්.එම්.ඒ. අසීස් ය. (2) වාප්පිච්චි මරික්කාර් ය.
(3) එම්.සී. සිද්දි ලෙබ්බේ ය. (4) මාප්පිල්ලෙ ලෙබ්බේ ආලිම් ය.
(5) කසාවත්තේ ආලිම් ය.

**35.** උමයියා වංශ පාලනයේ දෙවෙනි නිර්මාතෘවරයෙකු ලෙස සලකන්නේ
(1) යසීත් ය. (2) අබ්දුල් මලික් ය.
(3) මර්වාන් බින් හගම් ය. (4) උමර් ඉබ්නු අබ්දුල් අසීස් ය.
(5) සුලෙයිමාන් ය.

**36.** හිජ්රත්වලින් පසු අන්සාර්වරු සහ මුහාජිර්වරු සහෝදරයින් ලෙස සම්බන්ධ කළහ. අබ්දුර් රහ්මාන් බින් අවුෆ් (රළි)තුමා සමග සම්බන්ධ කරන ලද අන්සාරි සගයා වන්නේ,
(1) අබූ අයියූබල් අන්සාරි (රළි) ය. (2) සෑදු බින් සයීද් (රළි) ය.
(3) උක්කාසා (රළි) ය. (4) සෑදු බින් රබීඃ (රළි) ය.
(5) සෑදු බින් අබි වක්කාස් (රළි) ය.

- අංක **37** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව **X** හා **Y** යටතේ දී ඇති තොරතුරු කිසියම් ආකාරයකින් එකිනෙකට සම්බන්ධතාවක් දක්වයි. ඒ අනුව **Y** තීරුවේ ඇති ඒවා, **X** තීරුවේ ඇති ඒවා සමග නිවැරදි අනුපිළිවෙළින් ගළපා ඇති වරණය තෝරන්න.

**37.**

| X | Y |
|---|---|
| (i) කිතාබු සූරතුල් අර්ල් | A – ඉස්රායිලියියාත් |
| (ii) මදිනාහි ඉපදුණු ඉස්ලාමික නීතිවේදියා | B – ෂිආ |
| (iii) සමාජ සුබසිද්ධිය යන උප මූලාශ්‍රය | C – මස්ලහා |
| (iv) තෆ්සීර් කලාව සමග සම්බන්ධ වන එක් අංගයක් | D – ඉමාම් මාලික් |
| (v) ප්‍රධාන නබි සගයින් කිහිපදෙනෙකුට සාප කරන කණ්ඩායම | E – අල් කුවාරිස්මි |

(1) B C D E A (2) D E A C B (3) D E B C A (4) D E C A B (5) E D C A B

**38.**

| X | Y |
|---|---|
| (i) මසාදිරුල් අක්ලියියා | A – සිත්තාන්ත |
| (ii) තිම්මිවරු | B – ස්පාඤ්ඤය |
| (iii) අල් අන්තලූස් | C – ජිස්යා |
| (iv) අල් බිරූනි | D – තාරකා ශාස්ත්‍රය |
| (v) ගුබ්තා | E – ඉජ්මා |

(1) A C B D E (2) B C D E A (3) D E A C B (4) E A C B D (5) E C B D A

| | X | Y |
|---|---|---|
| **39.** | (i) මුජ්තහිද් මුත්ලක් | A – දැනුම් දෙන පාර්ශ්වය |
| | (ii) අස්මාඋර් රිජාල් | B – ඉමාම් ෂාෆිඊ |
| | (iii) අල් වෑදූ වල් වරීද් | C – තෆ්සීර් අල් කෂ්ෂාෆ් |
| | (iv) සමඛ්ෂරී | D – ගණිත විශාරදයා |
| | (v) අල්-කින්දි | E – මුෘතසිලා |

(1) A B C D E (2) B A E C D (3) B E D C A (4) C D E A B (5) E B C A D

| | X | Y |
|---|---|---|
| **40.** | (i) ඉජ්මා අස්සුකූති | A – මතු ලෝකය |
| | (ii) අල් ඉල්ලත් | B – කියාස් |
| | (iii) ලෝකය සවිබල ගැන්වීම | C – ෂීආ |
| | (iv) ම ආද් | D – අල් ඉමාරත් |
| | (v) අබ්දුල්ලා බින් සබා | E – නිහඬ අනුමැතිය |

(1) A B D E C (2) B A D C E (3) C D A B E (4) E B D A C (5) E D A C B

**41.** බයිඅතුර් රිල්වාන් යනු උස්මාන් (රලි)තුමා වෙනුවෙන් නබිතුමා සහ සගයින් අතර ඇති කර ගත් සම්මුතියක් වේ. මෙයට තවත් නමක් වනුයේ,

(1) බයිඅතුල් අකබා ය.
(2) බයිඅතුල් අකබතුස් සානි ය.
(3) බයිඅතුල් මීතාක් ය.
(4) බයිඅතුල් කලීෆා ය.
(5) බයිඅතුෂ් ෂජරා ය.

**42.** අරාබි අක්ෂර කලාව, ලලිත කලාවේ විශේෂිත කලාවකි. අරාබි ලේඛන කලා වර්ගයට අයත් වන්නේ,

(1) සන්ජානි ය. (2) මුහක්කික් ය. (3) ෂව්කානි ය. (4) මිස්මාර් ය. (5) තජ්වීද් ය.

**43.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පළමුවන මුස්ලිම් කථානායකතුමා එච්.එස්. ඉස්මායිල් වේ.
B - ආචාර්ය බදියුද්දීන් මහ්මූද් අධ්‍යාපන ඇමති ලෙස කටයුතු කළේ ය.
C - ශ්‍රී ලංකාවේ පැරණිම මස්ජිදුල් අබ්රාර් වැලිගමෙහි පිහිටා ඇත.
D - 'ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ වසර දාහක ජනවාර්ගික සමගිය' යන ග්‍රන්ථය රචනා කළේ ලෝනා දේවරාජා වේ.
E - කීර්ති ශ්‍රී රාජසිංහ පාලන සමයේ මඩිගේ බද්ද යන අංශය භාරව සිටියේ මූසා ආලිම් වේ.
F - ශ්‍රී ලංකාවේ අරාබි පාසල් අතුරෙන් මහරගම ගෆූරියියා අරාබි පාසල ශ්‍රී ලංකාවේ පළමු අරාබි පාසලයි.

ඉහත ඒවායින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C පමණි.
(2) A, B හා D ආදිය පමණි.
(3) A, C හා E පමණි.
(4) B, D හා E ආදිය පමණි.
(5) B, D හා F පමණි.

**44.** 'අන් නිකාහ් අල් ෆාසිත්' යන්නෙහි අර්ථය කුමක් ද?

(1) ෂරීආ විධිවිධාන රැකගනිමින් සිදු කෙරෙන විවාහ
(2) ස්ත්‍රියකගේ ඉද්දා කාලය අවසන් වීමට පෙර ඇයව විවාහ කර ගැනීම
(3) විවාහ ගිවිසුම වලංගු කාලය සීමා කිරීම
(4) ෂරීආවට විරුද්ධව සිදු කරන විවාහය
(5) ඉහ්රාම් ඇඳ සිටියදී සිදු කරන නිකාහ්

**45.** ඉන්දියාව තාරුල් ඉස්ලාම් වශයෙන් ප්‍රකාශිත කළ මෝගල් පාලකයා

(1) අවුරංගසීප් ය.
(2) හුමායූන් ය.
(3) අක්බර් ය.
(4) ෂාජහාන් ය.
(5) ෂහිරුද්දීන් බාබර් ය.

● අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙකක් බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2) , (3) , (4) , (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යෙදුම් යුගලය සහිත වරණය තෝරා, එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | නිවැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමුවන ප්‍රකාශය පැහැදිලිව විස්තර කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **46.** | කලීෆා වලීත් ඉබ්නු අබ්දුල් මලික්, උමයියා පාලකයන්ගෙන් කෙනෙකි. ඔහුගේ පාලන සමයේ ස්පාඤ්ඤය තාරික් බින් සියාද්ගේ නායකත්වයෙන් යටත් කරගන්නා ලදී. | හජ්ජාජ් බින් යුසුෆ්, අබ්බාසි පාලන කාලයේදීම ඉන්දියාව ආක්‍රමණය කළේය. |
| **47.** | කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්)තුමාගේ පාලන සමයේ දීවානුල් ජුන්ද්, දීවානුල් ෆරීද් ආදිය හඳුන්වා දෙන ලදී. | ශ්‍රී ලංකාවේ නිදහසෙන් පසු පිහිට වූ පළමුවන පාර්ලිමේන්තුවේ කම්කරු ඇමති ධුරය ආචාර්ය ටී.බී. ජායා මහතාට ලබා දුන්නේය. |
| **48.** | පෙර කාල වකවානුවලදී මුස්ලිම්වරු බහුතරයක් ජීවත් වූ වර්තමාන මදීනා, සිරියා ප්‍රදේශ හඳුන්වන අරාබි වචන යස්රිබ්, ෂාම් යනුවෙන් ඇත. | ඉස්ලාමීක ඉතිහාසයේ මදීනා, ආගමික හා සංස්කෘතික වර්ධනයෙහි ප්‍රචලිත ස්ථානයක් විය. ෂාම් අභියෝගයන්ට මුහුණ දීමට නබිතුමා විසින් පූර්ව දැනුම් දීමක් සිදුකොට තිබුණි. |
| **49.** | ඉජ්තිහාද් යටතේ බිහි වූ මූලාශ්‍ර මසාදිරුල් නක්ලියා ලෙස ගැනේ. | ෂාහ් වලියුල්ලා, මව්ලානා මව්දූදි යන දෙදෙනා ඉන්දියානු විද්වතුන් දෙදෙනෙකි. |
| **50.** | බරාඅත් රාත්‍රියේ අල්-කුර්ආනය පහළ කරන ලදී. | උම්මහාතුල් මුඃමිනීන් වූ කදීජාතුමිය හා ආයිෂාතුමිය එක්කුසේ උපන් සහෝදරියන් ය. |

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

2018.08.07 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) මුල්කාලීන මුස්ලිම්වරු ශ්‍රී ලංකා රාජ්‍යය සමග පවත්වා ගත් සබඳතා විස්තර කරන්න.

(ii) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ තත්ත්වය පිළිබඳ අගය කරන්න.

(iii) කුලෆාඋර් රාෂිදීන්වරුන්ගේ කලීෆා තේරීමේ ක්‍රමය පිළිබඳ විස්තර කරන්න.

(iv) කිලාෆතුර් රාෂිදාවට හා උමයියා කිලාෆතය අතර පැවති දේශපාලන හා පරිපාලන වෙනස්කම් විස්තර කරන්න.

(v) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල්(රහ්)තුමා නීති ක්ෂේත්‍රයේ වර්ධනයට ඉටු කළ දායකත්වය සහ ඔහු මුහුණ දුන් අභියෝග කෙටියෙන් සඳහන් කරන්න.

**2.** (i) නුබුව්වුත්තයෙන් පසු මක්කා ජීවිතයේදී නබිතුමා මුහුණ දුන් අභියෝග විස්තර කරන්න.

(ii) නබිතුමාගේ යුගයේ මස්ජිදුන් නබවියේ භූමිකාව ගැන ඇගයීමක් කරන්න.

(iii) අල්-කුර්ආනය ආරක්ෂා කිරීමට කලීෆා උස්මාන්(රලි)තුමාගේ දායකත්වය පැහැදිලි කරන්න.

(iv) කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස්(රහ්)තුමාගේ ආගමික ප්‍රතිසංස්කරණ ප්‍රයත්න කෙටියෙන් විස්තර කරන්න.

(v) අබ්බාසි කිලාෆතයේ බිඳ වැටීමට තුඩු දුන් සාධක **හතරක්** සඳහන් කොට, කෙටියෙන් විස්තර කරන්න.

**3.** (i) තෆ්සීර් බිල් මඃසූර් බෙලහීන වීමට හේතු වූ සාධක **හතරක්** සඳහන් කරන්න.

(ii) හිජ්රි පළමුවන ශතවර්ෂයේ තෆ්සීර් කලාවේ වර්ධනය ගැන කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) තෆ්සීර් කලාවේ ඉස්රායිලියියාත්වල බලපෑම ගැන විස්තර කරන්න.

(iv) නබිතුමාගේ සගයන් අල්-කුර්ආනය තේරුම් ගැනීමට අනුගමනය කළ ක්‍රමවේද **හතරක්** විස්තර කරන්න.

(v) තෆ්සීර් බිර්රඃයු ආශ්‍රිත තෆ්සීර් අතුරෙන් **හතරක්** ඒවායේ කතෘවරුන් සමග සඳහන් කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

## II කොටස

**4.** (i) තසව්වුෆ් එක් තනි කලාවක් ලෙස වර්ධනය වීමට තුඩු දුන් හේතු සඳහන් කොට පැහැදිලි කරන්න.

(ii) උමයියාවරුන්ගේ බිඳවැටීමට හේතු වූ කරුණු විස්තර කරන්න.

**5.** (i) ෂරීආහි උපමූලාශ්‍ර වන මස්ලහා මුර්සලා හෝ අල්-උර්ෆු ගැන පැහැදිලි කරන්න.

(ii) මතභේදයක් ඇති වූ විට මුජ්තහිද්වරුන් අනුගමනය කළ ආචාරධර්ම ක්‍රම අතුරින් **පහක්** සඳහන් කොට, විස්තර කරන්න.

**6.** (i) ඉස්ලාම් සමාජ සකස් කිරීමේදී පවුල් ජීවිතයේ භූමිකාව කෙසේ දැයි විස්තර කරන්න.

(ii) යුද්ධවලදී යුධ සෙබලුන් අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත ගැන නබිතුමාගේ දේශන සඳහන් කරන්න.

**7.** (i) බහුවාර්ගික සමාජ සමග සහජීවනය පිණිස ඉස්ලාම් දහමින් මගපෙන්වීම් සිදු කර ඇත්තේ කෙලෙස දැයි පැහැදිලි කරන්න.

(ii) "හිජ්රත් සංවිධානය කිරීමේදී සැලසුම් කිරීම ප්‍රධාන අංගයක් ලෙස පැවතුණි." පැහැදිලි කරන්න.

**8.** (i) ශ්‍රී ලංකාවේ මුස්ලිම් පුරෝගාමිකයන්ගෙන් කෙනෙකු වූ අයි.එල්.එම්.ඒ. අසීස්තුමාගේ ආගමික, සමාජ හා දේශපාලන දායකත්වය ගැන විමසන්න.

(ii) ලලිත කලාව පිළිබඳ ඉස්ලාමික අරමුණු සහ මස්ජිද් ගෘහ නිර්මාණ කලාවේ ප්‍රධාන අංග **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

***